# අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ තනතුරු

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන ශ්‍රේණියේ යෝග්‍ය සහ සුදුසුකම්ලත් නිලධාරීන්ගෙන් (අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට I වන ශ්‍රේණියට උසස් කිරීමට සුදුසුකම්ලත් නිලධාරීන් ද ඇතුළුව, ) පහත සඳහන් තනතුරුවලට පත්කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනුක්‍රමික අංකය | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 01 |
| 02 | ලේකම් (කම්කරු විනිශ්චය සභා) | 01 |

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් ඉල්ලුම්කර නොමැති වුවහොත්, වසර 03 ක සක්‍රීය සහ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන්, මෙම තනතුරේ පූර්ණ කාලීන පදනමින් රාජකාරී ආවරණය කිරීම පිණිස සේවයේ යෙදවීම සඳහා පත්කිරීම පිණිස සලකා බලනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 141 අනුව, රාජකාරී ආවරණය කිරීම පිණිස සේවයේ යෙදවීමේ පත්වීම්, තවදුරටත් වසරක කාලයක් දීර්ඝ කිරීමේ හැකියාව සොයා බැලීම සහිතව, උපරිම වශයෙන් වසරක සේවා කාලයක් සඳහා සිදුකරනු ලැබේ.

සෑම අයදුම්කරුවෙකු විසින්ම, ***මීට අමුණා ඇති ආකෘතියට අනුව*** නිසි පරිදි සකස් කරන ලද සිය අධ්‍යාපන සුදුසුකම් සහ වෘත්තීය පළපුරුද්ද පිළිබඳ ලුහුඬු විස්තරය (CV), දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ලේකම්, **අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය, නො 19, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10** යන ලිපිනය වෙත 2023 ඔක්තොම්බර් 18 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුය.

ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් සහ නියමිත ආකෘති පත්‍රය අනුව සකස් නොකරන ලද අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**2.0. අයදුම්කරුගේ අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් පිළිබඳ ලුහුඬු විස්තරය**

**2.1. පළපුරුද්ද සහ වෘත්තිය සුදුසුකම්;**

**i.** **සාමාන්‍ය පරිපාලනය පිළිබඳ** යටත් පිරිසෙයින් වසර 3 ක පළපුරුද්දක් ලබාතිබීම.

**ii.** **රාජ්‍ය පරිපාලනය, කළමනාකරණය, රාජ්‍ය ප්‍රතිපත්ති, මානව සම්පත් කළමනාකරණය, නීතිය, ව්‍යාපෘති සැලසුම්කරණය සහ කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ** පශ්චාත් උපාධියක් ලබාතිබීම.

**iii. රාජ්‍ය ප්‍රසම්පාදනය පිළිබඳ පුහුණුව අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබීමග**

**iv.** ඉංග්‍රීසි භාෂාව පිළිබඳව ප්‍රවීණත්වයක් ලබාතිබීම.

**2.2. ශක්තීන්;**

**i.** දූරදර්ශීභාවය
**i.** වෙනස්වීමේ නියෝජිතත්වය
**iii.**වැඩි දියුණුකරන්නාගේ භූමිකාව

**2.3. චර්යාත්මක ශක්‍යතාවයන්**

i. නායකත්වය
i. පුළුල් පරාසයක් ගවේෂණාත්මකව දැකීම
iii. වෙනසට අනුගත වීම සහ වැඩි දියුණුවට නැඹුරුව

**3.0. තෝරා ගැනීමේ ක්‍රමය**

සුදුසුකම්ලත්අයදුම්කරුවෙකු තෝරා ගැනීම, අධ්‍යාපන සුදුසුකම් සහ වෘත්තීය පළපුරුද්ද පිළිබඳ ලුහුඬු විස්තරය (CV) පදනම් කරගෙන, ජ්‍යෙෂ්ඨත්වය සහ කුසලතා අනුපිළිවෙල ඇගයීමට භාජනය කර, සම්මුඛ පරීක්ෂණයක් මඟින් සිදුකරනු ලැබේ. වැඩිම සුදුසුකම්ලත් සීමිත අයදුම්කරුවන් පිරිසක් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමේ නිර්ණායකය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 02/2022 දරන චක්‍රලේඛයේ 6(ආ) වගන්තිය කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

**3.1. ලකුණු ලබාදීමේ පටිපාටිය**

| නිර්ණායකය/ශීර්ෂය | උපරිම ලකුණු ප්‍රමාණය | ඇගයීමේ ක්‍රමවේදය |
|---|---|---|
| **ජ්‍යෙෂ්ඨත්වය**<br>වැඩිම ජ්‍යෙෂ්ඨත්වයක් සහිත අයදුම්කරුට උපරිම ලකුණු පිරිනමනු ලබන අතර, අනෙකුත් අයදුම්කරුවන්ට සිය ජ්‍යෙෂ්ඨත්වයේ අනුපිළිවෙලට සමානුපාතිකව ලකුණු පිරිනමනු ලැබේ. | ලකුණු 50 කි. | අධ්‍යාපන සුදුසුකම් සහ වෘත්තීය පළපුරුද්ද පිළිබඳ ලුහුඬු විස්තරය (CV) |
| **සාමාන්‍ය පරිපාලනය තුළ පළපුරුද්ද**<br><br>ක්ෂේත්‍රයේ/විෂය පථයට අනුගතවීම සේවා කාලයට අමතරව, එකී ක්ෂේත්‍රය තුළ දී එම විෂයට සම්බන්ධ වීම හෝ අනුගතවීම තුළින් ලබාගන්නා දැනුමේ හෝ ප්‍රවීණත්වයේ ප්‍රබලතාව ඇගයීමට භාජනය කරනු ලැබේ. | ලකුණු 20** කි. | |
| **වෘත්තීය සුදුසුකම් සහ පර්යේෂණ**<br><br>**1) රාජ්‍ය පරිපාලනය, කළමනාකරණය, රාජ්‍ය ප්‍රතිපත්ති, මානව සම්පත් කළමනාකරණය, නීතිය, ව්‍යාපෘති සැලසුම්කරණය සහ කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය හෝ තොරතුරු තාක්ෂණය හෝ රාජ්‍ය ප්‍රසම්පාදනය පිළිබඳ පශ්චාත් උපාධියක්/වෘත්තීමය සුදුසුකම් ලබාතිබීම.**<br><br>අ. පර්යේෂණ පාදක පශ්චාත් උපාධිය - ලකුණු 7 කි.<br>ආ. පන්ති කාමරයක හැදෑරීමක් මත | ලකුණු 10 කි. | |

| | | |
|---|---|---|
| ලබාගත් පශ්චාත් උපාධිය - ලකුණු 6 කි.<br>ඇ. පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - ලකුණු 4 කි.<br>ඈ. උපාධි / පශ්චාත් උපාධි සහතිකය/උසස් ජාතික ඩිප්ලොමාව - ලකුණු 3 කි.<br>ඉ. ඩිප්ලෝමාව - ලකුණු 2 කි.<br><br>**2) රාජ්‍ය පරිපාලන, කළමනාකරණය, මහජන ප්‍රසම්පාදනය, තොරතුරු තාක්ෂණය හෝ රාජ්‍ය සේවයේ විනය කළමනාකරණය වැනි විෂය ක්ෂේත්‍රවල පුහුණුව.**<br><br>අ. මාස 3 ක් හෝ ඊට වැඩි කාලයක් - ලකුණු - 1 කි.<br>ආ. දින 10 ක් හෝ ඊට වැඩි කාලයක් - ලකුණු - 0.5 කි.<br>ඇ. දින 3 ක් හෝ ඊට වැඩි කාලයක් - ලකුණු - 0.2 කි.<br><br>3) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය*<br><br>අ. පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ රජයේ පුහුණු ආයතනයකින් ලබාගත් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමාව/IELTS විභාගයේ සමස්ථ ලකුණු අගය 6.5 හෝ ඊට ඉහළ, TOEFL – IBT 79 හෝ ඊට ඉහළ, TOEFL – CBT 213 හෝ ඊට ඉහළ, TOEFL – PBT හෝ ඊට ඉහළ හෝ - ලකුණු 02.<br><br>ආ. පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ රජයේ පුහුණු ආයතනයකින් ලබාගත් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතිකය - ලකුණු 01 කි.<br><br>*ඉහලම සුදුසුකම සඳහා පමණක් ලකුණු පිරිනමනු ලැබේ. | | |
| **ශක්තීන්**<br><br>ඉහත 2.2 වගන්තියේ පරිදි, අයදුම්කරු පෙළඹවීමකට භාජනය කළ යුතු, කාර්යයන් ඵලදායීව ඉටුකර තිබිය යුතුය. | ලකුණු 10** කි. | සම්මුඛ පරීක්ෂණය |

| | | |
|---|---|---|
| **චර්යාත්මක ශක්‍යතාවයන්**<br><br>ඉහත 2.3 වගන්තියේ සඳහන් කර ඇති පරිදි, ඵලදායීව සිදුකිරීමට අවශ්‍ය විය යුතු වන කාර්යයන් සහ ක්‍රියාකාරකම්. | ලකුණු 10 **කි. | සම්මුඛ පරීක්ෂණය |

සටහන 1: ඉහත ලකුණු පිරිනැමීමේ පටිපාටියේ "පිළිගත් විශ්වවිද්‍යාලය" යන්නෙන් ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක් අදහස් වේ.

සටහන 2: ඉහත ලකුණු පිරිනැමීමේ පටිපාටියේ සඳහන් කර ඇති සියලුම පශ්චාත් උපාධි/වෘත්තීමය සුදුසුකම්,

i. ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින්; (වෙනත් උපාධි ප්‍රදානය කරනු ලබන ආයතනවලින් ලබාගත් එවැනි සුදුසුකම් එම කොමිෂන් සභාව විසින් පිළිගෙන තිබිය යුතුය.) හෝ

ii. රජයේ පුහුණු ආයතනයකින් හෝ රජය පිළිගත් විදේශ ආයතනයකින්; හෝ

ලබාගෙන තිබිය යුතුය.

ලේකම්
අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

දිනය 27/09/2023

වසන්තා පෙරේරා
ලේකම්
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
අංක: 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.